# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1768/12 - 2012 ජූලි මස 24 වැනි අඟහරුවාදා - 2012.07.24

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 6/2001

**2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත**

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 26 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 105 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සාදනු ලබන රීති.

සභාපතිනිය,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය.

2012 ජූලි මස 20 වැනි දින,
කොළඹ දී ය.

රීති

1. 2011 මාර්තු මස 18 වැනි දින අංක 1697/27 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත 2004 මැයි මස 17 වැනි දින අංක 1341/8 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ 2004 ණය ගෙවීමේ හැකියාවේ සීමා (සාමාන්‍ය රක්ෂණ) රීති, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :–

(1) එහි 4 වැනි රීතියේ (1) වැනි උපරීතියේ -

(අ) එහි (ඇ) ඡේදයේ (iv) වැනි උපඡේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"(iv) අවස්ථාවෝචිත පරිදි, ප්‍රාග්ධනය සහ පොළිය නැතහොත් කල් පිරීමේ අගය, ආයෝජන මට්ටම් අනුපාතිකයක් දරනු ලබන යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් සහතික කරන ලද වත්කම් මගින් සනාථ කරනු ලබන සුරැකුම්පත් ; හෝ යම් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇති සමාගමක් විසින් නිකුත් කරනු ලැබුවා වූ ද සාධන පත්‍රය සඳහා ආයෝජන මට්ටම් අනුපාතිකයක් දරනු ලබන්නා වූ ද වත්කම් මගින් සනාථ කරනු ලබන සුරැකුම්පත්" - 10%

(ආ) එහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :–

"(ඇඇ) යම් බැංකුවක ජංගම ගිණුම්වල පවතින ශේෂය ඃ

එසේ වුව ද රක්ෂණකරුගේ ප්‍රධාන මූල්‍ය නිලධරයා ණය ගෙවීමේ හැකියා සීමා ගණනය කිරීම සඳහා සලකා බලනු ලබන ජංගම ගිණුම් ශේෂ සනාථ කරමින් එහි කාර්තුමය, වාර්ෂික හා මණ්ඩලය විසින් නියම කරනු ලබන ඕනෑම අවස්ථාවකදී මාසික වාර්තා සමඟ ලිඛිත සහතික පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය". - 4%

(2) එහි 5අ රීතියේ (අ) සහ (ආ) ඡේද වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

''(අ) ශ්‍රී ලංකාවෙන් පිටත දී නිකුත් කර ඇති අවස්ථාවක දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද යම් ආස්ථිත්‍යයක් විසින් නිකුත් කර ඇති අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි එම වත්කම හෝ ආස්ථිත්‍යය -

(i) ණය ප්‍රමාණීකරන නියෝජ්‍යායතනයක් විසින් අනුප්‍රමාණ කර ඇත්නම් සහ උපලේඛනයේ I වන කොටසේ නිශ්චිතව දැක්වෙන අවම ජාත්‍යන්තර අවශ්‍යතා හෝ එම ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනයක් විසින් කලින් කලට අවම ජාත්‍යන්තර අවශ්‍යතාව ලෙස ලබා දී ඇති වෙනත් යම් ආයෝජන මට්ටම් අනුප්‍රමාණ වර්ගීකරනයක් සපුරාලන්නේ නම් පමණක් ; හෝ

(ii) මණ්ඩලය විසින් කලින් කල අනුමත කරනු ලබන වෙනත් යම් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනයක් විසින් අනුප්‍රමාණ කර ඇත්නම් සහ එම ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනය විසින් ලබා දී ඇති අවම ආයෝජන මට්ටම් අනුප්‍රමාණ වර්ගීකරණය සපුරාලනු ලබන්නේ නම් පමණක්,

එම වත්කම ආවේශ්‍ය වත්කමක් ලෙස සලකනු ලැබිය යුතු ය ; සහ

(ආ) ශ්‍රී ලංකාව තුළ දී නිකුත් කර ඇති අවස්ථාවක දී හෝ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරඇති යම් ආස්ථිත්‍යයක් විසින් නිකුත් කර ඇති අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි එම වත්කම හෝ ආස්ථිත්‍යය -

(i) ණය ප්‍රමාණීකරන නියෝජ්‍යායතනයක් විසින් අනුප්‍රමාණ කර ඇත්නම් සහ උපලේඛනයේ II වන කොටසේ නිශ්චිතව දැක්වෙන අවම අවශ්‍යතා හෝ එම ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනයක් විසින් කලින් කලට අවම අවශ්‍යතාව ලෙස ලබා දී ඇති වෙනත් යම් ආයෝජන මට්ටම් අනුප්‍රමාණ වර්ගීකරනයක් සපුරාලන්නේ නම් පමණක් ; හෝ

(ii) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනයක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබ ඇති වෙනත් යම් තැනැත්තකු විසින් අනුප්‍රමාණ කර ඇත්නම් සහ එම ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනය විසින් ලබා දී ඇති අවම ආයෝජන මට්ටම් අනුප්‍රමාණ වර්ගීකණය සපුරාලනු ලබන්නේ නම් පමණක්,

එම වත්කම ආවේශ්‍ය වත්කමක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

(3) එහි 8 රීතියේ "ආයෝජන මට්ටම් අනුප්‍රමාණය" යන යෙදුමේ අර්ථනිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපනය ආදේශ කිරීමෙන් :–

'' ආයෝජන මට්ටම් අනුප්‍රමාණය" යන්නෙන්, පූර්ව මාස අටක කාලය ඇතුළත ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනයක් විසින් පවරා දෙන ලද යම් ණය අනුප්‍රමාණයක් අදහස් වේ ;".

08-262/1

එල්.ඩී.බී. 6/2001

**2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත**

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 26 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 105 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සාදනු ලබන රීති.

සභාපතිනිය,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය.

2012 ජූලි මස 20 වැනි දින,
කොළඹ දී ය.

රීති

1. 2011 මාර්තු මස 18 වැනි දින අංක 1697/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් සංශෝධිත 2002 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 1255/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ 2002 ණය ගෙවීමේ හැකියාවේ සීමා (දීර්ඝ කාලීන රක්ෂණ) රීති, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :–

(1) එහි 13 වැනි රීතියේ (1) වැනි උපරීතියේ -

(අ) එහි (ඇ) ජේදයේ (iv) වැනි උපජේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"(iv) අවස්ථාවෝචිත පරිදි, ප්‍රාග්ධනය සහ පොළිය නැතහොත් කල් පිරීමේ අගය, ආයෝජන මට්ටම් අනුපාතිකයක් දරනු ලබන යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් සහතික කරන ලද වත්කම් මගින් සනාථ කරනු ලබන සුරැකුම්පත් ; හෝ යම් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇති සමාගමක් විසින් නිකුත් කරනු ලැබුවා වූ ද සාධන පත්‍රය සඳහා ආයෝජන මට්ටම් අනුපාතිකයක් දරනු ලබන්නා වූ ද වත්කම් මගින් සනාථ කරනු ලබන සුරැකුම්පත්" - 10%

(ආ) එහි (ඇ) ජේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :–

"(ඈඇ) යම් බැංකුවක ජංගම ගිණුම්වල පවතින ශේෂය ඃ - 4%

එසේ වුව ද රක්ෂණකරුගේ ප්‍රධාන මූල්‍ය නිලධරයා ණය ගෙවීමේ හැකියා සීමා ගණනය කිරීම සඳහා සලකා බලනු ලබන ජංගම ගිණුම් ශේෂ සනාථ කරමින් එහි කාර්තුමය, වාර්ෂික හා මණ්ඩලය විසින් නියම කරනු ලබන ඕනෑම අවස්ථාවකදී මාසික වාර්තා සමග ලිඛිත සහතික පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය".

(2) එහි 14අ රීතියේ (අ) සහ (ආ) ජේද වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"(අ) ශ්‍රී ලංකාවෙන් පිටත දී නිකුත් කර ඇති අවස්ථාවක දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද යම් ආස්ථිත්‍යයක් විසින් නිකුත් කර ඇති අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි එම වත්කම හෝ ආස්ථිත්‍යය -

(i) ණය ප්‍රමාණීකරන නියෝජ්‍යායතනයක් විසින් අනුප්‍රමාණ කර ඇත්නම් සහ උපලේඛනයේ I වන කොටසේ නිශ්චිතව දැක්වෙන අවම ජාත්‍යන්තර අවශ්‍යතා හෝ එම ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනයක් විසින් කලින් කලට අවම ජාත්‍යන්තර අවශ්‍යතාව ලෙස ලබා දී ඇති වෙනත් යම් ආයෝජන මට්ටම් අනුප්‍රමාණ වර්ගීකරණයක් සපුරාලන්නේ නම් පමණක් ; හෝ

(ii) මණ්ඩලය විසින් කලින් කල අනුමත කරනු ලබන වෙනත් යම් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනයක් විසින් අනුප්‍රමාණ කර ඇත්නම් සහ එම ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනය විසින් ලබා දී ඇති අවම ආයෝජන මට්ටම් අනුප්‍රමාණ වර්ගීකරණය සපුරාලනු ලබන්නේ නම් පමණක්,

එම වත්කම ආවේශ්‍ය වත්කමක් ලෙස සලකනු ලැබිය යුතු ය ; සහ

(ආ) ශ්‍රී ලංකාව තුළ දී නිකුත් කර ඇති අවස්ථාවක දී හෝ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති යම් ආස්ථිත්‍යයක් විසින් නිකුත් කර ඇති අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි එම වත්කම හෝ ආස්ථිත්‍යය -

(i) ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනයක් විසින් අනුප්‍රමාණ කර ඇත්නම් සහ උපලේඛනයේ II වන කොටසේ නිශ්චිතව දැක්වෙන අවම අවශ්‍යතා හෝ එම ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනයක් විසින් කලින් කලට අවම අවශ්‍යතාව ලෙස ලබා දී ඇති වෙනත් යම් ආයෝජන මට්ටම් අනුප්‍රමාණ වර්ගීකරනයක් සපුරාලන්නේ නම් පමණක් ; හෝ

(ii) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනයක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබ ඇති වෙනත් යම් තැනැත්තකු විසින් අනුප්‍රමාණ කර ඇත්නම් සහ එම ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනය විසින් ලබා දී ඇති අවම ආයෝජන මට්ටම් අනුප්‍රමාණ වර්ගීකණය සපුරාලනු ලබන්නේ නම් පමණක්,

එම වත්කම ආවේශ්‍ය වත්කමක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

(3) එහි 17 රීතියේ "ආයෝජන මට්ටම් අනුප්‍රමාණය" යන යෙදුමේ අර්ථනිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපනය ආදේශ කිරීමෙන් :–

'' ආයෝජන මට්ටම් අනුප්‍රමාණය" යන්නෙන්, පූර්ව මාස අටක කාලය ඇතුළත ණය ප්‍රමාණීකරණ නියෝජ්‍යායතනයක් විසින් පවරා දෙන ලද යම් ණය අනුප්‍රමාණයක් අදහස් වේ ;".

08-262/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.